

ෂිම් ඉයුන් හා

## කොරියාවේ ෂිම් ඉයුන් හා SHIM EUN - HA

ෂිම් ඉයුන් හා කොරියාවේ අංක එකේ නිළියයි. ජනප්‍රියත්වයෙන් අග තැන්පත් වුවත්, ඇය වසර 2002 දී සිනමා රංගනයට සමුදුන්නාය. දැන් ඇය ප්‍රංශයට වී චිත්‍ර අඳින්නීය. 1998 දී තිරගත වුණු CHRISTMAS IN AUGUST රෝමාන්ත ආදර කතාවේ කළ රංගනයට ඇය, ආසියාවේ විශිෂ්ටයන් අතරට එක් වූවාය. මෙම සිනමාපටය සියොල් අගනුවර පමණක් හාරලක්ෂ වරක් පමණ තිරගත වී තිබේ. අදටත් ආසියානු සිනමා අධ්‍යයනයේදී අනිවාර්යයෙන්ම CHRISTMAS IN AUGUST සිනමා පටය උදාහරණයක් ලෙස ගනු ලැබේ.

## හොංකොං හි ජෝසපින් සියාවෝ - JOSEPHINE SIAO

ඇල්සයිමර් රෝගයෙන් පෙළෙන මාමණ්ඩිය රැක ගැනීමට වෙර දරන මවකගේ චරිතය ජෝසපින් සියාවෝ වර්ෂ 1995 දී තිරගත වුණු "සමර් ස්නෝ" සිනමා පටයේ නිරූපනය කළ අතර, එය ඇය ආසියාවේ විශිෂ්ට නිළියක ලෙස නම් කිරීමට එම රංගනයටම ඇය 1995 හේතුවිය. බර්ලින් සිනමා උළෙලේ හොඳම නිළිය ලෙසින් සම්මාන ලැබුණි. ජෝසපින් සියාවෝ හැටේ දශකයේ වීර චරිතවලට පණ පෙව්වාය. එහෙත් පසුව ඇය ඉතා සාර්ථක ලෙස වැඩිහිටි චරිත නිරූපනය කළාය. දැන් ඇය කාලය යොදවන්නේ සමාජ සේවයටයි. ජෝසපින් සියාවෝ හොංකොං සිනමා ප්‍රජාවේ ගෞරවණීය ආදරණීය චරිතයකි.



ZEBA
පාකිස්තානයේ සීබා



JOSEPHINE SIAO



RUAN LINGYU



FANN - WONG

රූමත් සීබා ප්‍රේමාන්විත චරිත රංගනයට උපන් හපන්නියකි. පැරණි සිනමා තාරකාවියක් වුවත් තවමත් ඇය පාකිස්තානයේ රසික රසිකාවියන් අතර මහත් සේ ජනප්‍රියය. සීබා 1966 වර්ෂයේදී රඟපෑ අර්මාන් (ARMAN) සිනමා පටයේ චරිතය ඇය ආසියාවේ විශිෂ්ට ශිල්පිනියක ලෙස නම් කිරීමට හේතු විය. අර්මාන් පාකිස්තානු සිනමාවේ සති 75 ක් පුරා තිරගත වුණු පළමු උර්දු සිනමා පටයයි.

## චීනයේ රුආන් ලින්ග්යු RUAN LINGYU

චීන සිනමාවේ නොමැකෙන නාමයක් බවට රුආන් ලින්ග් යු නාමය පත්වී තිබේ. 1926 – 1935 දක්වා ඇය සිනමා පට 29 කට රංගනයෙන් දායක වී ඇති අතර, අවාසනාවන්ත ලෙස වයස අවුරුදු විසි හතරේදී ජීවිතයෙන් සමුගත්තාය.ආදරය, රාජකාරිය, කාර්යබහුලකම, සංස්කෘතික පෙරළිය ඇයට තම ජීවිතය එපා කළ කරුණයි. වයස විසි හතරේදී සියදිවි නසා ගත් රුආන් ලින්ග්යු ගේ අවමංගල්‍ය උත්සවයට ලක්ෂ තුනක ජනකායක් සහභාගී වී තිබේ.නිහඬ සිනමා යුගය වර්ණවත් කළ රුආන් ලින්ග්යු ආසියාවේ සැම කාලයටම විශිෂ්ට නිළියක ලෙසින් නම් කෙරුණේ වර්ෂ 1934 දී තිරගත වුණු The Goddess සිනමා පටයේ දරුවන් වෙනුවෙන් ජීවිතයම පරිත්‍යාග කළ කාන්තාවක ලෙස කළ රංගනයටයි.

## සිංගප්පූරුවේ FANN - WONG

රංගනය, ගායනය, මෝස්තර නිරූපනය යන කුසලතා ත්‍රිත්වයෙන් පිරිපුන් ෆැන් හොලිවුඩ් නිර්මාණ වලට දායකවීමට ලැබුණු එක් සිංගප්පූරු නිළියකි. SHANGHAI KNIGHTS චිත්‍රපටයෙන් රංගනයෙන් ඇය අන්තර්ජාතික මට්ටමෙන් ජනප්‍රිය වූවාය. THE TRUTH ABOUT JANE AND SAM (1999 දී තිරගත විය) සිනමා පටයේ නව යෞවනියක ලෙස කළ රංගනය ඇය විශිෂ්ටයකු කිරීමට සමත්විය. හොංකොං සිනමා උළෙලකදී ද ඇයගේ නම හොඳම නිළිය ලෙස මෙම සිනමා රංගනය සඳහාද නිර්දේශ විය.




## තායිලන්තයේ පෙචාරා චාවොරට් (PETCHORA CHAOWARAT)

පෙචාරා තායි සිනමාවේ ස්වර්ණමය යුගයේ සංකේතයයි. කොණ්ඩා මෝස්තර හා වටකුරු නෙත් යුවළ තායි වැසියන්ට ඇය පිළිබඳ මතකය අවදි කරන කරුණුයි. වර්ෂ 1961 – 1979 දක්වා ඇය සිනමා පට තුන්සියයකට අධික ගණනකට රංගනයෙන් දායක වී තිබේ. හැට, හැත්තෑ දශකවල තායිලන්තයේ අංක එකේ නිළිය වශයෙන් වැජඹුනාය. 1964 .තායි ජාතික සිනමා උළෙලේදී හොඳම නිළිය වූයේ පෙචාරාය. ඇය ආසියාවේ විශිෂ්ට නිළියක ලෙස නම් කෙරුණේ 1970 වසරේ MORAK LUK THUNG සිනමා පටයේ ගොවියෙකුට පෙම් බැඳි ධනවත් කාන්තාවක ලෙස කළ රංගනයටයි.

අන්තර්ජාලයෙනි - සටහන - චම්පිකා දිලානි රත්නායක